මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone

# මතුගම අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම් වැඩසටහන - 2020

| පුරවැසි අධ්‍යාපනය | 11 ශ්‍රේණිය | කාලය : පැය 01 යි |
|---|---|---|

**ශිෂ්‍යයාගේ නම :-** ........................................................................................................................

## I පත්‍රය

සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. අතීතයේදී ඍජු ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණ පදනම් කරගෙන පාලන කටයුතු සිදු කළ රාජ්‍ය වන්නේ,
   - i බ්‍රිතාන්‍ය
   - ii ඇතැන්ස්
   - iii ස්විස්ටර්ලන්තය
   - iv ඉන්දියාව
2. ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක විශේෂ ලක්ෂණයක් වන්නේ මින් කුමක්ද?
   - i ඒක් දේශපාලන පක්ෂයක් රට පාලනය කිරීම.
   - ii දේශපාලන පක්ෂ මාරුවෙන් මාරුවට රට පාලනය කිරිම.
   - iii අධ්‍යාපනයට හා සමාජ සුභසාධනයට ප්‍රමුඛත්වය ලැබීම.
   - iv මහජනතාවට පාලනයට සහභාගී වීමට අයිතියක් තිබීම.
3. ඍජු ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමේ දී ගැටලුවක් වන්නේ,
   - i රාජ්‍යයක ජනගහණය අධික විම ය.
   - ii විවිධ පක්ෂ පැවතීමයි.
   - iii නියමිත කාල සීමාව තුළ මැතිවරණ පැවැත්වීම ය.
   - iv පුරවැසියන්ගේ ආදායම් විෂමතාවයක් පැවතීම ය.
4. එක් පක්ෂ ක්‍රමයක් ඇති රටක් වන්නේ,
   - i බ්‍රිතානයයි.
   - ii ඇමරිකාවයි.
   - iii චීනයයි.
   - iv ඕස්ට්‍රේලියාවයි.
5. ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක ජනතාව සතු බලය හැඳින්වෙන්නේ,
   - i සර්වජන ඡන්ද බල යනුවෙනි.
   - ii නීතියේ ආධිපත්‍ය බලය යනුවෙනි.
   - iii පරමාධිපත්‍ය බලය යනුවෙනි.
   - iv සර්වජන ඡන්ද බලය යනුවෙනි.
6. රාජ්‍යයක මූලික ලක්ෂණ නිවැරදිව දැක්වෙන පිළිතුර තෝරන්න.
   - i භූමිය, ජනගහණය, ආණ්ඩුව, ස්වාධිපති බලය
   - ii භූමිය, ආණ්ඩුව, ස්වාධිපති බලය, විරුද්ධ පක්ෂය
   - iii ජනගහණය, ස්වාධිපති බලය, අධිකරණය, ආණ්ඩුව
   - iv ජනගහණය, ආණ්ඩුව, විධායක බලය, ජනාධිපති
7. මධ්‍යම ආණ්ඩුව සතු පරිපාලන බලතල යම් ප්‍රමාණයක් ප්‍රාදේශීය පාලන ඒකක වෙත පවරාදීම යනු,
   - i බලය බෙදීමයි.
   - ii බලය විමධ්‍යගත කිරීමයි.
   - iii බලය පවරාදීමයි.
   - iv බලය නිගමනය කිරීමයි.
8. ශ්‍රී ලංකාවේ පළාත් සභාවක ප්‍රධාන ඇමතිවරයා පත්කරනු ලබන්නේ,
   - i අග්‍රාමාත්‍යවරයා විසිනි.
   - ii ජනාධිපතිවරයා විසිනි.
   - iii කථානායක විසිනි.
   - iv ආණ්ඩුකාරවරයා විසිනි.
9. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව පළාත් සභාවක මහ ඇමතිවරයාද ඇතුළුව අමාත්‍ය මණ්ඩලය
   - i හතරදෙනෙකුගෙන් සමන්විත ය.
   - ii පස්දෙනෙකුගෙන් සමන්විත ය.
   - iii හයදෙනෙකුගෙන් සමන්විත ය.
   - iv හත්දෙනෙකුගෙන් සමන්විත ය.
10. ශ්‍රී ලංකාවේ පරිපාලන ක්‍රියාවන් නිසා පුරවැසියෙකුගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය හා කඩවීම සම්බන්ධයෙන් පැමිණිලි කළ යුතු වන්නේ,
    - i නීතිපතිවරයාට ය.
    - ii ජනාධිපතිවරයාට ය.
    - iii කථානායකවරයාට ය
    - iv ඔම්බුඩ්ස්මන්වරයාට ය.

11. ඇමරිකා ඒක්සත් ජනපදයේ මධ්‍යම ආණ්ඩුව සතු බලතලයක් වන්නේ,

| | |
|---|---|
| i අධ්‍යාපනය | iii පළාත් පාලනය |
| ii සෞඛ්‍යය | iv බදු පැනවීම හා එක්රැස් කිරිම |

12. සන්ධීය රාජ්‍යයක බලය බෙදා හැරිම සිදු කරනු ලබන්නේ,
    - i ඒකාධිපති හා මධ්‍යම ආණ්ඩුව අතරය
    - ii ඒකාධිපති හා ප්‍රාන්ත ආණ්ඩු අතරය
    - iii මධ්‍යම ආණ්ඩුව හා ප්‍රාන්ත ආණ්ඩු අතරය
    - iv මධ්‍යම ආණ්ඩුව හා ප්‍රාන්ත ආණ්ඩුකරු අතරය
13. බහු සංස්කෘතික සමාජයක යහපාලනය ක්‍රියාත්මක වීමෙන් අත්වන වැදගත් ප්‍රතිඵලයකි.
    - i ඒකිනෙකාට ගරු කිරිමට හුරුවීම.
    - ii රාජ්‍ය භාෂා කිහිපයක් කථා කළ හැකිවිම.
    - iii විවිධ සංස්කෘතීන් පිළිබද අවබෝධයක් ඇතිවීම.
    - iv ජනවර්ග හා විවිධ කණ්ඩායම් අතර විශ්වාසය තහවුරුවීම.
14. ආර්ථික භාණ්ඩයක් හා ආර්ථික නොවන භාණ්ඩයක් පිළිවෙලින් දැක්වෙන නිවැරදි පිළිතුර කුමක්ද?

| | |
|---|---|
| i ආහාර හා ජලය | iii ආහාර හා ඇඳුම් |
| ii හිරු එළිය හා ඖෂධ | iv ඇඳුම් හා ආහාර |

15. සන්ධීය රාජ්‍යයක ප්‍රධාන ලක්ෂණයක් වන්නේ මින් කුමක්ද?
    - i මධ්‍යම ආණ්ඩුවකින් පාලනය සිදුවීම.
    - ii බලය විමධ්‍යගත කිරීම.
    - iii බලතල නැවත පවරා ගත හැකිවීම.
    - iv උත්තර මන්ත්‍රී මණ්ඩලයක් සිටිම.
16. ආර්ථිකයක සිදුවන ක්‍රියාවලිය අනුපිළිවෙලින් දැක්වෙන පිළිතුර  තෝරන්න.
    - i නිෂ්පාදනය, පරිභෝජනය, බෙදාහැරිම
    - ii නිෂ්පාදනය, බෙදාහැරිම, පරිභෝජනය
    - iii නිෂ්පාදනය, ගබඩා කිරිම, බෙදාහැරිම
    - iv නිෂ්පාදනය, ගබඩා කිරිම, පරිභෝජනය
17. බහු සංස්කෘතික සමාජයක පුරවැසියෙකු සතු ගුණාංගයක් වන්නේ,
    - i අන්‍ය ආගම් වැළඳ ගැනීම.
    - ii අන්‍ය සංස්කෘතිවලට ගරු කිරිම.
    - iii මහ ජාතියේ සංස්කෘතියට ගරු කිරිම ය.
    - iv අන්තර් විවාහ සිදු කිරිම.
18. පුද්ගලයා තුළ, පුද්ගලයන් අතර, පවුල තුළ , පවුල් අතර අතිවන ගැටුම් හඳුන්වන්නේ,

| | |
|---|---|
| i සාර්ව ගැටුම් ලෙස ය. | iii සූක්ෂම ගැටුම් ලෙස ය. |
| ii පවුල් ගැටුම් ලෙස ය. | iv පුද්ගල ගැටුම් ලෙස ය. |

19. එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තිය අනුව ළමයෙකු වශයෙන් හදුනා ගැනීමට භාවිතා කරනු ලබන වයස් සීමාව කුමක්ද?

| | |
|---|---|
| i අවු : 18ට අඩු | iii අවු : 15ට පහළ |
| ii අවු : 16ට අඩු | iv අවු : 14ට පහළ |

20. ශ්‍රී ලංකාවේ ඉහළ අධිකරණ ආයතනය වන්නේ.

| | |
|---|---|
| i මහාධිකරණය යි. | iii ශ්‍රේෂ්ඨාධිකරණය යි. |
| ii අභියාචනාධිකරණය යි. | iv යුද්ධාධිකරණය යි. |

21. නිෂ්පාදන සාධක නිවැරදිව සඳහන් වරණය තෝරන්න.
   i ශ්‍රමය, ප්‍රාග්ධනය, භූමිය, වැටුප
   ii භූමිය, ශ්‍රමය, ප්‍රාග්ධනය, ව්‍යවසායකත්වය
   iii භූමිය, පොලිය, ප්‍රාග්ධනය, වැටුප
   iv භූමිය, වැටුප, ශ්‍රමය, ප්‍රාග්ධනය
22. රටක පුරවැසියෙකු සතු මූලික අයිතිවාසිකම් ඇතුළත් ප්‍රධාන ලියවිල්ල හැඳින්වෙන නම කුමක්ද?
   i දණ්ඩ නීති සංග්‍රහය
   ii නීති සංග්‍රහය
   iii ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව
   iv අයිතිවාසිකම් ප්‍රඥප්තිය
23. මිනීමැරුම් හා සම්බන්ධ නඩු විභාග කිරිමේ බලය ඇති අධිකරණය වන්නේ,
   i මහාධිකරණය යි.
   ii ශ්‍රේෂ්ඨාධිකරණය යි.
   iii දිසා අධිකරණය යි.
   iv අභියාචනාධිකරණය යි.
24. ආරවුල් විසඳීමේ විකල්ප ක්‍රමයක් වන බේරුම්කරණය සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
   i බේරුම්කරණය සිදුවන ආකාරය අනුව කොටස් තුනකට වර්ග කල හැකි ය.
   ii බේරුම්කරු විසින් ආරවුල සම්බන්ධව විභාගයක් කරනු නොලැබේ.
   iii බේරුම්කරණය නිසා කාලය හා මුදල් ඉතිරි කරගත නොහැක.
   iv වෘත්තීමය ආරවුල් නීතිමය රාමුවක් තුළ විසඳා ගැනීමට කටයුතු කිරිම බේරුම්කරණය යි.
25. නීතියේ ආධිපත්‍ය තුළ තහවුරු වී තිබෙන සමාජයක දැකිය හැකි ලක්ෂණයක් වන්නේ,
   i නීතිය ඉදිරියේ සියලු දෙනාම සමාන පුද්ගලයෝ ලෙස නොසැලකීම.
   ii අප්‍රමාදව යුක්තිය ඉටුවීමක් දක්නට නොලැබීම.
   iii විනිශ්චයකරුවන්ට තම තීන්දු ගැනීමේදී බලපෑම් කළ හැකිවීම.
   iv නීතිය පිළිබඳ සෑම පුරවැසියෙකුටම අවබෝධයක් තිබීම.
26. මරණ දඬුවම නියම වූවෙකුගේ එම දඬුවම ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය නිර්දේශය ලබාදීම සිදු කරන්නේ,
   i නීතිපතිතුමා විසිනි.
   ii මහාධිකරණය යි.
   iii පළාත්බද මහ අධිකරණය යි.
   iv දිසා අධිකරණය යි.
27. 1978 ශ්‍රී ලංකාවේ දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ,
   i විධායක බලය සහිත ජනාධිපති ධූරයක් ඇති කරන ලදී.
   ii නාමික විධායකය පමණක් ක්‍රියාත්මක විය.
   iii රාජ්‍ය මන්ත්‍රණ සභාව පිහිටුවන ලදි.
   iv සමානුපාතික නියෝජන ක්‍රමය අහෝසි කරන ලදි.
28. ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ පිළිවෙලින් දැක්වෙන පිළිතුර තෝරන්න.
   i කෝල්බෲක්, සෝල්බරි, ඩොනමෝර්, කෲ මැකලම්, මැනිං
   ii සෝල්බරි, ඩොනමෝර්, කෲ මැකලම්, කෝල්බෲක්, මැනිං
   iii කෝල්බෲක්, කෲ මැකලම්, මැනිං, ඩොනමෝර්, සෝල්බරි
   iv සෝල්බරි, ඩොනමෝර්, මැනිං, කෲ මැකලම්, කෝල්බෲක්
29. ගෝලීයකරණය නිසා ශ්‍රී ලංකාවට මුහුණ පෑමට සිදුවිය හැකි අහිතකර බලපෑමක් වන්නේ,
   i බුද්ධිගලනය වේගවත්වීම.
   ii විදේශ ආයෝජන ගලා ඒම.
   iii නව කර්මාන්ත බිහිවීම.
   iv නව තාක්ෂණික ශිල්ප ක්‍රම හඳුන්වාදීම.
30. ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය සකස් කිරීමේ දී සැලකිල්ලට ගෙන ඇති මූලික අරමුණු 4 නිවැරදිව දැක්වෙන පිළිතුර තෝරන්න.
   i අධ්‍යාපනය, ආරක්ෂාව, පැවැත්ම, සංවර්ධනය
   ii ආරක්ෂාව, පැවැත්ම, සංවර්ධනය, සහභාගීත්වය
   iii සෞඛ්‍ය, අධ්‍යාපනය, පැවැත්ම, සංවර්ධනය
   iv අධ්‍යාපනය, සහභාගීත්වය, පැවැත්ම, සංවර්ධනය

31. යුතුකම් ප්‍රධාන කොටස් දෙකකට බෙදේ. ඉන් එකක් සදාචාරාත්මක යුතුකමක් ලෙස සැලකේ. අනෙක් යුතුකම් කොටස වන්නේ,

i ආගමික යුතුකම් ය.
ii සමාජීය යුතුකම් ය.
iii නීතිමය යුතුකම් ය.
iv පුරවැසි යුතුකම් ය.

32. ශ්‍රී ලංකාව ජනරජයක් බවට පත් වූයේ,

i 1931 ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ මගින් ය.
ii 1947 ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ මගින් ය.
iii 1972 ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ මගින් ය.
iv 1978 ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ මගින් ය.

33. පාරිභෝගික භාණ්ඩයක් හා අන්තර් භාණ්ඩයක් පිළිවෙලින් දැක්වෙන පිළිතුර තෝරන්න.

i ඖෂධ, ආහාර ද්‍රව්‍ය
ii යන්ත්‍ර සූත්‍ර, ආහර
iii ඇඳුම් පැලඳුම්, පොහොර
iv ගොඩනැගිලි, සිමෙන්ති

34. " කෙනෙකුට සැරයටියක් වනමින් පාරේ ගමන් කළ හැකි වුවද ඒම නිදහස අනෙකාගේ නාසය අගින් කෙළවරවිය යුතු ය." මෙම ප්‍රකාශය කරන ලද්දේ,

i මහාචාර්ය ගානර්ය
ii හැරල්ඩ් ජේ ලැස්කිය
iii T.H ග්‍රීන්ය
iv ඒබ්‍රහම් ලින්කන්ය

35. කාන්තාවන්ට එරෙහිව සියලුම ආකාරයේ වෙනස්කම් තුරන් කිරීම පිළිබඳ සම්මුතිය වන්නේ,

i NATO
ii SAFTA
iii CEDAW
iv UNISEF

36. ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතනවලට අයත් නොවන කාර්යයක් වන්නේ,

i පොදු කියවීම් ශාලා පවත්වා ගෙන යාම
ii මහජන වැසිකිලි ඉදිකිරීම හා නඩත්තු කිරිම
iii අතුරු මාර්ග ඉදිකිරීම
iv ප්‍රදේශයේ කුඩා පාසල් ඉදිකිරීම

37. බ්‍රිතාන්‍ය පාලන සමයේ හඳුන්වා දෙන ලද ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ අතුරින් ශ්‍රී ලාංකිකයන්ට වැඩි දේශපාලන අවස්ථා හිමි වූයේ කුමන ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයේදී ද?

i කෝල්බෲක්
ii මැනිං
iii ඩොනමෝර්
iv කෲ මැකලම්

38. ආදිවාසී ජනතාවගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා 1989 දී ආදිවාසී හා ගෝත්‍රික ජනතාව පිළිබඳ සම්මුතිය හඳුන්වා දුන්නේ,

i ලෝක සෞඛ්‍ය සංවිධානයයි
ii යුනිසෙෆ් ආයතනය
iii ලෝක කම්කරු සංවිධානය
iv ජාතීන්ගේ සංගමයයයි

39. පහත ප්‍රකාශ අතුරින් වඩාත්ම නිවැරදි ප්‍රකාශය තෝරන්න.

i පරිසරයේ සම්පත් භුක්තිවිඳීමේ ස්වභාවික පරිසරය රැක ගැනීම අත්‍යවශ්‍ය නොවේ.
ii රටේ පුරවැසියන් අයිතිවාසිකම් භුක්ති විඳිය යුත්තේ පවතින නීතිමය රාමුව තුළ නොවේ.
iii අයිතිවාසිකම් හා බැඳුණු යුතුකම් ඉටු කිරීම ප්‍රජාතන්ත්‍රවාදී ජීවන ක්‍රමයක මූලික ලක්ෂණයකි.
iv ශිෂ්‍යයෙකු වශයෙන් රටට වැඩදායි පුද්ගලයෙකු යටතේ ජීවත්වීම සිදු කල හැකිය.

40. පාරිසරික ගැටලු ඇතිවීම සඳහා මුල්වන ප්‍රධානම හේතුව වනුයේ,

i වනාන්තර විනාශ කිරීම
ii සම්පත් අධිපරිභෝජනය
iii සමාජ ආර්ථික පරිහානිය
iv ලෙඩ රෝග හා සෞඛ්‍ය ගැටලුය

මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය
Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone
மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம்
මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය
Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone

# මතුගම අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම් වැඩසටහන - 2020

| පුරවැසි අධ්‍යාපනය | 11 ශ්‍රේණිය | කාලය : පැය 02 යි |
|---|---|---|

## II පත්‍රය

පළවන ප්‍රශ්නය ඇතුලුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

01.

i ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක ස්වරූප දෙක නම් කරන්න.
ii ද්වි පක්ෂ ක්‍රමය පවතින රටවල් දෙකක් නම් කරන්න.
iii ජාතික රාජ්‍ය බිහි වීමට බලපාන හේතු දෙකක් නම් කරන්න.
iv සන්ධීය ආණ්ඩු ක්‍රමයක් පවතින රටවල් දෙකක් නම් කරන්න.
v ශ්‍රී ලංකාවේ නැගෙනහිර පළාතට අයත් දිස්ත්‍රික්ක දෙකක් නම් කරන්න.
vi නීති මූලාශ්‍ර දෙකක් නම් කරන්න.
vii ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන විශේෂ නීති වර්ග දෙකක් නම් කරන්න.
viii ව්‍යවස්ථාදායකයේ (පාර්ලිමේන්තුවේ) කාර්යයන් දෙකක් නම් කරන්න.
ix ජලය දූෂණය වන අවස්ථා දෙකක් නම් කරන්න.
x පරිසර සංරක්ෂණය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන ආයතන දෙකක් නම් කරන්න.

(ල- 2×10=20)

02.

i ශ්‍රී ලංකාවේ ඡන්ද දායකයන්ට ඡන්දය පාවිච්චි කිරීමට ලැබෙන මැතිවරණ අවස්ථා දෙකක් නම් කරන්න. (ල- 02 )
ii නිදහස් හා සාධාරණ මැතිවරණයක තිබිය යුතු ලක්ෂණ 3ක් නම් කරන්න.(ල- 03 )
iii (a) ප්‍රජාතන්ත්‍රවාදී ජන සමාජයක මාධ්‍ය මගින් ඉටු කළ යුතු කාර්යභාරයන් 3ක් සඳහන් කරන්න.
(b) ඉන් එක් කාර්යභාරයක් කෙටියෙන් පැහැදිලි කරන්න.

(ල- 3+2 )

03.

i. නූතන රාජ්‍යයන්හි දක්නට ලැබෙන ආණ්ඩුක්‍රම දෙක නම් කරන්න. (ල- 02 )
ii. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අනුව බලතල වර්ගීකරණය කර ඇති ලැයිස්තු 3 නම් කරන්න. (ල- 03 )
iii. පළාත් පාලන ආයතන 3ක් නම් කර නගරාධිපති සතු බලතල /කාර්යයන් කෙටියෙන් විස්තර කරන්න. (ල- 05 )

04.

i සංස්කෘතිය යන්න අර්ථ දැක්වීමට නිර්වචන ඉදිරිපත් කළ දාර්ශනිකයන් දෙදෙනෙකු නම් කරන්න. (ල- 02 )
ii ශ්‍රී ලංකාව බහු සංස්කෘතික සමාජයක්වීම කෙරෙහි බලපා ඇති සාධක 3ක් නම් කරන්න.
(ල- 03 )
iii (a) බහු සංස්කෘතික සමාජයක යහපැවැත්ම සඳහා පුරවැසියෙකු විසින් ප්‍රගුණ කළ යුතු ගුණාංග 3ක් දක්වන්න.
(b) ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල- 3+2 )

05.

i. භාණ්ඩ නිෂ්පාදනය සඳහා ප්‍රධාන ශිල්පීය ක්‍රම දෙක නම් කරන්න. (ල- 02 )
ii. නිෂ්පාදන සඳහා යොදා ගන්නා ප්‍රාග්ධන භාණ්ඩ 3ක් නම් කරන්න. (ල- 03 )
iii. ධනවාදී අර්ථ ක්‍රමයක මූලික ලක්ෂණ 3ක් නම් කරන්න.
iv. ඉන් එක් කරුණක් කෙටියෙන් විස්තර කරන්න. (ල-3+2)

06 .

i ගැටුමක් ඇතිවීමට බලපාන හේතු දෙකක් නම් කරන්න. (ල-02)
ii අන්තර්ජාතික වශයෙන් ගැටුම් ඇතිවිය හැකි අවස්ථා 3ක් නම් කරන්න. (ල-03)
iii (a) ගැටුම් නිරාකරණය කර ගත හැකි ක්‍රම තුනක් දක්වන්න.
(b) ඉන් එක් ක්‍රමයක් කෙටියෙන් විස්තර කරන්න. (ල-3+2)

07

i නීතියේ ගුණාංග දෙකක් නම් කරන්න. (ල- 02 )
ii දේශිය නිතීයේ ප්‍රධාන කොටස් දෙක නම් කරන්න. (ල- 03 )
iii අප්‍රමාදව හා අපක්ෂපාතිව යුක්තිය පසිදලිම සිදු නොවිම නිසා ඇතිවිය හැකි අවාසිදායක තත්වයන් තුනක් නම් කර ඉන් එකක් කෙටියෙන් විස්තර කරන්න. (ල- 05 )